“කවර හෝ ගැත්තෙකුට අල්ලාහ් යටත් වැසියන් පාලනය කිරීමට සළස්වා, ඔහු මිය යන දින ඔහුගේ යටත් වැසියන් රවටා සිටි තත්ත්වක මිය යන්නේ නම්, අල්ලාහ් ඔහුට ස්වර්ගය තහනම් කරනු මිස වෙනත් කිසිවක් නැත.”

සැබැවින්ම මම අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) කරමින් සිටි
ප්රකාශයකට සවන් දී ඇත්තෙමි යැයි පවසා මඃකිල් ඉබ්නු යසාර් අල්-මුදනී (රළියල්ලාහු
අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: “කවර හෝ ගැත්තෙකුට අල්ලාහ් යටත් වැසියන් පාලනය කිරීමට සළස්වා, ඔහු මිය යන දින ඔහුගේ යටත් වැසියන් රවටා සිටි තත්ත්වක මිය
යන්නේ නම්, අල්ලාහ් ඔහුට ස්වර්ගය තහනම් කරනු මිස වෙනත් කිසිවක් නැත.”
[صحيح] [متفق عليه]

සැබැවින්ම අල්ලාහ් සෑම කෙනෙකුවම ජනයාට වගකිව යුතු භාරකරුවකු බවට පත් කර ඇතැයි නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් දන්වා සිටියි. එය නායකයකු මෙන් පොදු භාරකාරත්වයක් වුව ද නිවසේ බිරියක් සිටින ගෘහ මුලිකයා මෙන් විශේෂිත භාරකාරත්වයක් වුව ද එක සමානය. ඔහු ඔහුගේ පාලනයේ අඩුපාඩු දක්වයි. ඇයට වංචා කරයි. ඇයට උපදෙස් නොදෙයි. ඇයගේ ආගමික මෙන්ම ලෞකික අයිතිවාසිකම් අපතේ යවයි. මෙම දරුණු දඬුවමට මොහු ද සුදුසුකම් ලබනු ඇත.

http://sunnah.global/hadeeth/si/show/5335